පානදුර නගර සභාව
කළුතර දිස්ත්‍රික්කය
--------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පානදුර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූලය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලද රු.514,816 ක පුස්තකාල පොත් වටිනාකම වර්ෂයේ වියදමක් ලෙස හා ආදායම් ආධාර යටතේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2005 වර්ෂයට අදාල රු.10,500 ක ගෙවල් කුලී තැන්පතුවක් නිදහස් කිරීම සමාලෝචිත වර්ෂයේ වියදමක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ වියදම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී කැබ් රථයක් මිලදී ගැනීම හා ආරක්ෂිත කැමරා පද්ධතියක් (CCTV) සවිකිරීම සිදුකර නොතිබුණද ඒ වෙනුවෙන් රු.8,600,000 ක ණයහිමි වෙන්කිරීම් සිදුකර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල රු.300,275 ක ණයහිමි වටිනාකමක් ණයහිමියන් ලෙස වෙන් නොකිරීම හේතුවෙන් වර්ෂයේ ණයහිමි වටිනාකම හා වර්ෂයේ වියදම රු.300,275 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2018 වර්ෂය තුලදී මිලදී ගන්නා ලද රු.211,320 ක් වටිනා ලීබඩු උපකරණ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට ණයහිමි වෙන් කිරීම් සිදුකර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගන්නා ලද රු.250,000 ක් වටිනා කොන්ක්‍රීට් මේස හා බංකු ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.250,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ වෙන්දේසියෙන් ලද රු.17,945 ක මුදල වෙනත් ආදායම් යටතේ දක්වනු වෙනුවට මූලධන ආධාර යටතේ ගිණුම් ගතකර තිබුණි.

(ඌ) 2017 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ගෙවිය යුතු වූ රු.531,241 ක මුදල සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

1.3.2 **<u>නොසැසඳුණු ගිණුම්</u>**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.148,494,806 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.1,534,367 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

1.3.3 **<u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

<u>ලැබිය යුතු ගිණුම්</u>

චෙක්පත් අගරුවීම මත ලැබිය යුතු රු.7,650 ක මුදලක් 2012 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 **<u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>**

සමීක්ෂණ මණ්ඩල වාර්තා නොමැතිවීම නිසා එකතුව රු.10,758,730 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1:3:5 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) නගර සභා ආඥාපනත (255 අධිකාරය) | | |
| (i) 159 (1) (ඉ) ඡේදය | 150,000 | පළාත් පාලන ආයතන ක්‍රීඩා උළෙල වෙනුවෙන් වියදම් දැරීම සඳහා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) 165 (ඇ) (1) ඡේදය | --- | සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කරනු ලබන ඉඩම් වල විකුණුම් මිලෙන් සියයට එකක ආදායමක් සභාව විසින් ලබාගත යුතු වුවත් එසේ සිදු නොකර ආදායම් පරිපාලක විසින් සකස් කර තිබූ දළ ඇස්තමේන්තුවෙන් සියයට එකක මුදලක් පමණක් අයකර ගෙන තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016 දෙසැම්බර් 23 දිනැති අංක 1999 දරන ගැසට් පත්‍රය | 121,200 | නගර සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් සවිකිරීම හා ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් දක්වා ඇති පරිදි ගාස්තු අය කළයුතු වුවත් ප්‍රචාරක දැන්වීම් /නාම පුවරු 44 ක් සඳහා අදාල ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008 | --- | මධ්‍යම පරිසර අධිකාරිය මගින් ලබාදී ඇති උපදෙස් ප්‍රකාර පරිසර බලපත්‍ර ලබා ගත් කාලය සම්පූර්ණ |

| | | | |
|---|---|---|---|
| | ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් පත්‍රය | | වීමේදී නැවත එකී බලපත්‍ර අළුත් කිරීමට කටයුතු නොකළ ආයතන 04 ක් විය. |
| | | | ඍ |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | --- | ආයතනය සතු වාහනවල ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2:1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.48,067,145 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.60,395,961 ක් විය.

2:2 <u>ආදායම් පරිපාලනය</u>

2:2:1 <u>ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර්31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දින මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 44,052,000 | 45,430,038 | 37,151,958 | 11,779,927 | 45,451,000 | 43,993,974 | 31,189,526 | 13,041,32 |
| (ii) කුලී | 1,506,000 | 1,560,013 | 1,542,113 | 17,900 | 3,568,000 | 3,563,380 | 3,439,903 | 123,47 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,675,000 | 415,810 | 1,837,154 | - | 2,473,000 | 364,367 | 2,315,933 | 8,00 |
| (iv) වෙනත් ආදායම් | 76,271,000 | 55,000,000 | 23,968,441 | - | 60,957,000 | 40,000,000 | 67,884,945 | |

2.2.2 <u>ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට සභාවේ සමස්ථ හිඟ ආදායම රු.13,172,799 ක් වූ අතර වර්ෂයට අදාල බිල් කිරීම් රු.102,405,861 ක් විය. වර්ෂය තුල ලැබීම්, කපා හැරීම් හා ගැළපුම් රු.103,780,833 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට සමස්ථ ආදායම් හිඟය රු.11,797,827 ක් විය.

2.2.3 **වරිපනම් හා බදු**

**වරිපනම්**

i. සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.23,350,372 ක වරිපනම් හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.15,399,211 ක් හෙවත් සියයට 66 ක් අයකරගෙන තිබුණි.

ii. සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කිරීම් රු.42,413,882 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ඉන් රු.30,705,731 ක් හෙවත් සියයට 72 ක් අයකරගෙන තිබුණි.

2.2.4 කුලී

වෙළඳ ස්ථාන කුලී

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.593,287 ක වෙළඳ ස්ථාන කුලී හිඟයක් පැවති අතර 2018 සැප්තැම්බර් 20 දින වනවිට ඉන් රු.386,517 ක් හෙවත් සියයට 65 ක් අයවිය යුතුව තිබුණි.

(ආ) වසර 05 ඉක්මවූ රු.386,260 ක් වූ හිඟ වෙළඳ ස්ථාන කුලී ශේෂයෙන් රු.27,793 ක් පමණක් අයකරගෙන තිබූ අතර ඉතිරි රු.358,467 අයකර ගැනීමට හෝ වෙළඳ ස්ථාන හිමිකරුවන්ට එරෙහිව නඩු පැවරීමට හෝ කටයුතු කර නොතිබුණි.

2.2.5 බලපත්‍ර ගාස්තු

2017 වර්ෂයේ වෙළඳ බලපත්‍ර සමීක්ෂණයට අනුව බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර ස්ථාන 23 ක් වසා ඇති බවට ආදායම් පරීක්ෂක වාර්තා කර තිබුණද , එය තහවුරු කිරීමේ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

2.2.6 මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු රු.96,105,750 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3:1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම , ජනතාවගේ සුබ විහරණය , පහසුව සහ සුභ සාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

නගර සභා ආඥා පනතේ 157 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 06 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ප්‍රතිපාදන නොසැලසීම

පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් 92 ක ගෙන් 60 ක් සඳහා පමණක් වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන සැලසීම නිසා කර්තව්‍යයන් 32 ක් ඉටු කළ නොහැකි වී තිබුණු අතර ප්‍රතිපාදන වෙන් නොකල ව්‍යාපෘති 10 ක් වර්ෂය තුල නිම කර තිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

නගර සභාවේ 2015 , 2016 , 2017 වර්ෂ වල කසළ බැහැර කිරීම වෙනුවෙන් බාහිර පාර්ශවයන් වෙත පිළිවෙලින් රු.19,479,079 , රු.31,059,000 හා රු.30,635,703 ක මුදලක් ගෙවා තිබූ අතර 2016 හා 2017 වර්ෂ වල කසළ කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රු.5,316,973 ක

වියදමක් දරා තිබුණි.කසළ කළමනාකරණය වෙනුවෙන් දායක වන කාර්ය මණ්ඩල වියදම් හා ඒ වෙනුවෙන් යොදා ගන්නා වාහන වලට දරන ලද වියදම් ද ඇතුලත්ව වාර්ෂිකව විශාල වියදමක් කසළ බැහැර කිරීම වෙනුවෙන් දැරුවද , නිසි කසළ කළමනාකරණ සැලැස්මක් තුළින් එකී වියදම් අවම කිරීමට කටයුතු කර නොතිබුණි. තවද 2010 වර්ෂයේදී අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සහ සභා අරමුදල් රු.774,593 ක් වැය කර ජීව වායු ඒකකයක් ඉදිකර තිබුණද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් ජනමාධ්‍ය මගින් ලබාගත් දැනුවත් වීමක් හැර වෙනත් මඟ පෙන්වීම් හෝ වැඩපිළිවෙලක් සභාව සතුව නොතිබුණි.

3:2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) ගැසට් පත්‍රයේ පළ කිරීමකින් තොරව මුදල් කමිටු තීරණයක් මත නගර ශාලාව වෙන් කිරීමේ ගාස්තු තීරණය කර තිබුණද , එකී තීරණය අනුව ගාස්තු අයකර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) අංක 5438 දරන ඉඩම් අනු බෙදුමට අදාළව මාර්ගය පුළුල් කිරීම සඳහා 2014 වර්ෂයේදී වෙන්දේසිකරු විසින් රු.216,000 ක මුදලක් සභාවේ තැන්පත් කර තිබූ නමුත් එකී කාර්යය ඉටුකිරීමකින් තොරව අදාළ මුදල් ආදායමට ගෙන තිබුණි.

(ඇ) නගර සභාව සතුව ඇති පිහිනුම් තටාකය සඳහා 2015 වර්ෂයේ සිට ඒ සඳහා දැනුම ඇති පුද්ගලයෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබූ අතර 2016 හා 2017 වර්ෂවලදී මෙම තටාකය පවත්වාගෙන යාමේ ශුද්ධ පාඩුව රු.2,950,239 ක් විය. මෙම පිහිනුම් තටාකය භාවිතා කරන්නන්ගෙන් ගාස්තු අයකළද තටාකය භාවිතා කරන පුද්ගලික පුහුණු කරන්නන්ගෙන් කිසිදු ගාස්තුවක් අය නොකිරීම නිසා ඔවුන් සභාව සතු දේපළ භාවිතයෙන් විශාල ආදායමක් උපයාගන්නා බව නිරීක්ෂණය විය.

(ඈ) සභාව සතු ත්‍රීරෝද රථ ගාල් පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ත්‍රීරෝද රථ පිළිබඳ තොරතුරු ලබා නොගැනීම නිසා සභා බල ප්‍රදේශයේ ලියාපදිංචි රථ ගාල් 68 න් 10 ක් පමණක් 2017 වර්ෂයේදී බලපත්‍ර ලබාගෙන තිබුණි.

3:3 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු

(i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු සිටිය යුතු ලේකම් තනතුරේ වැඩ ආවරණය කිරීමට කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ නිලධාරිනියක පත්කර තිබුණි.

(ii) ගණකාධිකාරි තනතුර වර්ෂය පුරාම පුරප්පාඩුව පැවතුණි.

(iii) සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය තුළ සෞඛ්‍ය කම්කරුවන් 100 ක් සේවය කළද ඉන් 49 ක් නිත්‍ය තනතුරෙන් පරිබාහිරව වෙනත් සේවාවල යොදවා ඇති අතර වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 48 න් 27 ක් වෙනත් රාජකාරි සඳහා යොදවා තිබුණි.

(ආ) සේවක ණය

2017 දෙසැම්බර් 31 දින ට අය නොවන සේවක ණය ශේෂය රු1,086,533 ක් වූ අතර එයින් 2010 ට පෙර සිට පැවත එන රු.521,639 ක් වූ හඳුනා නොගත් සේවක ණය ශේෂයක් හා සේවය හැර ගොස් වසර 05 ඉක්මවූ සේවකයෙකුගෙන් අයවිය යුතු රු.8,925 ක ණය ශේෂයක් පැවතුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පොදු වෙළඳ පොළ සංකීර්ණ ගොඩනැගිල්ල අනතුරුදායක තත්ත්වයකට පත් වී තිබීම

1993 සහ 1994 වර්ෂ වලදී වර්ග අඩි 25,830 ක විශාලත්වයකින් යුතුව මහල් දෙකක් සඳහා සැලසුම් කර , එක් මහලක් පමණක් සාදා නිම කරන ලද මෙම වෙළඳ සංකීර්ණය ඇතුළත කඩකාමර 250 කින් හා පිටත

කඩකාමර 70 කින් සමන්විත වේ. එහෙත් 2016 අගෝස්තු 24 දින ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් ලබා දෙන ලද වාර්තාව අනුව මෙම ගොඩනැගිල්ලෙහි කොන්ක්‍රීට් ව්‍යුහය දිරාපත් වී තිබීම, අළුත්වැඩියා කිරීම ඵලදායි නොවීම, ගොඩනැගිල්ල භාවිතා කරන්නන්ට අනතුරුදායක තත්ත්වයක් ඇතිවිය හැකි බැවින් කඩා ඉවත් කළයුතු බව අනාවරණය විය. එහෙත් මේ දක්වාම (2018 ජුනි 30 ) එම වෙළඳසැල් පවත්වාගෙන යමින් තිබුණි. තවද , 2017 ජුලි 04 දින පැවති පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාවේදීද මෙම කරුණ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග වෙත යොමුවන ලෙස නියෝග කර ඇතත් , මේ දක්වා එම නියෝගය ක්‍රියාත්මක කිරීමට නගර සභාවට හැකියාවක් ලැබී නොතිබුණි.

3.5 <u>ප්‍රසම්පාදනය</u>

3.5.1 <u>සැපයීම්</u>

(අ) පුටු 20 ක් මිලදී ගැනීම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා එක් පුටුවක් රු.3,338 ක් වූ අවම මිල ඉදිරිපත් කර තිබූ ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් ආයතනයෙන් එකී මිලදී ගැනීම සිදු නොකර ලියාපදිංචි නොවූ දම්රෝ ආයතනයෙන් එක් පුටුවක් රු.4,027 බැගින් පුටු 20ක් මිළදීගෙන රු.80,550 ක් ගෙවා තිබුණි.

(ආ) ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේදී අවශ්‍ය භාණ්ඩ වල පිරිවිතරයන් නිසි පරිදි නොදැක්වීම නිසා මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවන්ගෙන් අවම මිල ඉදිරිපත් කළ ආයතන වල පිරිවිතරයන් නොගැලපීම මත ප්‍රතික්ෂේප කර වැඩි මිල ගණන් ඉදිරිපත් කළ ආයතන වෙතින් මිලදී ගැනීම් සිදු කර තිබුණි.

4. **<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

4:1 **<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ගත හා තථ්‍ය ආදායම් සියයට 03 සිට සියයට 5,224 දක්වාත්, වියදම් සියයට 02 සිට සියයට 182 දක්වාත් වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. **<u>පද්ධති හා පාලන</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| <u>පද්ධතිය</u> | | <u>අඩුපාඩුව</u> |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | i | ගිණුම් වලින් අත් හැරීම් හා අඩුවෙන් හා වැඩියෙන් සටහන් කිරීම් තිබීම |
| | ii | ලෙජර් ගිණුම්වල අඩුපාඩු පැවතීම |
| (ආ) කසළ කළමණාකරණය | i | කොම්පෝස්ට්කරණ කාර්යයන් සඳහා යොමු නොවීම |
| | ii | ප්‍රතිචක්‍රීයකරණ කටයුතු සඳහා යොමු නොවීම |
| | iii | කසළ බැහැර කිරීමේ වියදම් පාලනය නොකිරීම |
| (ඇ) ආදායම් පරිපාලනය | i | හිඟ ආදායම් අය නොකිරීම |
| | ii | බදු තක්සේරු නිසි කළට සිදු නොකිරීම |
| (ඈ) අය වැය පාලනය | i | තථ්‍ය ආදායම් හා අයවැය ගත ආදායම් අතර විශාල විචලනයන් පැවතීම |
| | ii | තථ්‍ය වියදම් හා අයවැය ගත වියදම් අතර විශාල විචලනයන් තිබීම |
| (ඉ) ස්ථාවර වත්කම් | | ලේඛන යාවත්කාලීන කර නොතිබීම |